# හාෆ් ශීට් කඩෙන් ගැනීම



## අපේ කාලේ කතන්දර



**රසික සූරියආරච්චි**

පාසල් යෑම ඇරඹුණු හෝඩියේ පන්තියේ දී භාවිතා කරන්නට පටන් ගත් ගල්ලෑල්ලෙන් සහ ගල්කූරෙන්, තුනේ පන්තියේ දී ඇක්සයිස් පොතට සහ පැන්සලට උසස් වීමක් ලද අපි, පහේ පන්තියේ දී ඒ මිනිරන් පැන්සලෙන් තීන්ත පෑනට උසස් වීමු.

එතෙක් භාවිතා කළ පිටු හතළිහේ සාමාන්‍ය ප්‍රමාණයේ ඇක්සයිස් පොත් වෙනුවට අප හයේ පන්තියේ සිට ලිවීම සඳහා, සාපේක්ෂව කොළ විශාල සංඛ්‍යාවක් ඇති, මොනිටර් පොත් භාවිතා කරන්නට පටන් ගත්ත ද, තීන්ත පෑන් වෙනුවට හුරුබුහුටි බෝල්පොයින්ට් කාබන් පෑන් භාවිතා කරන්නට පටන් ගත්ත ද, මට නම් ඊළඟට ලැබුණු සැබෑම උසස් වීම වූයේ උසස් පෙළ හදාරන්නට ගිය පසු සිදු වූ මොනිටර් පොතෙන් හාෆ් ශීට්වලට ලද උසස් වීමයි.
එය, ඒ කාලයේ දී ම සිදුවුණු, කොට කළිසමෙන් දිග කළිසමට මාරුවීම හා සමාන පිම්මක් විය.

අප සැම දන්නා පරිදි හාෆ් ශීට් යනුවෙන් අදහස් කෙරෙනුයේ, විශේෂයෙන්ම ඒ දිනවල කාර්යාලවල ලිපි යතුරු ලිවීම සඳහා භාවිතා කරන ලද, ඒ-4 ප්‍රමාණයේ සුදු පැහැති කඩදාසි වේ. ඒ දිනවල මේවා වාලච්චේනේ පිහිටි කඩදාසි සංස්ථා කම්හලේ නිෂ්පාදනය කෙරුණු බව හාෆ් ශීට් වෙළඳ පොළට නිකුත් කරන බණ්ඩලවල මුද්‍රණය කර තිබුණි.

සාමාන්‍යයෙන් නිවෙස්වල ලිපි කටයුතු සඳහා භාවිතා වූයේ එක්කෝ ඇක්සයිස් පොතක මැදින් කඩා ගත් කොළ ය. නැති නම් හාෆ් ශීට්වලටත් විශාල වූ ප්‍රමාණයේ ෆූල්ස් කැප් නමින් හැඳින් වුණු රැල් සහිත කොළ ය.
අප කුඩා කාලයේ පෞද්ගලික අංශයේ ලිපි කරු රැකියාවක් කළ අපේ බාප්පාගෙන් අපේ ගමේ සිටි අපට වඩා වැඩිමහල් සමහර ළමයින් "මාමේ අපට හාෆ් ශීට් ගෙනත් දෙන්න!" යැයි ඉල්ලනවා මට ඇසී තිබේ.

මොනිටර් පොත්වල ලියනවාට වඩා මා හාෆ් ශීට්වල සටහන් ලිවීම ප්‍රිය කරන්නට හේතු කිහිපයක්ම තිබුණි.

පොත් නිපදවන්නා සළකුණු කර ඇති තනිරූල්, කොටුරූල් ඉරි අතරේ ම අපට හිරවන්නට අවශ්‍ය නැත. එක් දිනක් පාසල් යන්නට නොහැකි වූ විට, ඒ සඳහා පිටු කීයක් ඉඩ හරින්නද යන ප්‍රශ්ණය මෙහි දී පැන නොනඟී. හාෆ් ශීට් භාවිතා කරන මිතුරන් අතර ණයට දෙන්නටත්, ණයට ගන්නටත් හැකි නිසා, මොනිටර් පොතක් ගෙදර අමතක වූ විට ඇතිවන ලොකු ප්‍රශ්නය ද නැත. ඒ සේරමටත් වඩා, වෙනදා මෙන් මොනිටර් පොත් ගොන්නක් වෙනුවට, සටහන් ලියන හාෆ් ශීට් බහාලූ කාඩ්බෝඩ් ෆයිල් කවරයක් පමණක් රැගෙන සරසවි සිසුන් සේ සිංහ සෙයියාවෙන් අපට පාසල් යා හැකිය.

අනිත් වැදගත් කාරණය වූයේ මොනිටර් පොත්වල මිළ හා සසඳන විට, හාෆ් ශීට්වල මිළ සැලකිය යුතු තරම් වැඩි නොවීමයි.
පාසල් දිවියේ උසස් පෙළ සමය ද, විශ්ව විද්‍යාලවල ගත කළ කාලය ද හාෆ් ශීට් අතරම ගෙවී ගියේය. ඉන් පසුව එළැඹි සමයේ දී මා අතින් සිදුවුණු එකම ලිවීම වූයේ ඉඳහිට ලියවෙන කවියක් පමණි. පුදුමයකට මෙන් ඒ සඳහා මා භාවිතා කිරීමට පෙළඹී තිබුණේ මොනිටර් පොතකි. එයට හේතුව වූයේ කොල කැබලිවල ලියවෙන දේ එකට එක් කර තබා ගැනීමේ තිබුණු ප්‍රායෝගික අපහසුවයි.

මේ කාලයේ එක් සති අන්තයේ දිනක මට මගේ ඥාති නිවසකට යාමට සිදුවිය. මේ නිවසේ සිටි මගේ ඥාති සොහොයුරා ඒ දිනවල සාමාන්‍ය පෙළ විභාගය සමත්ව, උසස් පෙළ හැදෑරීම අරඹන්ට නියමිතව තිබුණි. ඥාති නිවසට ගෙන යන බිස්කට් කෙසෙල්වලට අමතරව ඥාති සොහොයුරාට තෑගි දීම සඳහා යමක් මිළදී ගැනීමට මට අවශ්‍ය විය.

මට එක්වරම සිහියට ආවේ ඔහුට දිය හැකි හොඳම ත්‍යාගය හාෆ් ශීට් බවයි.

නගරයේ පොත් කඩයකට ගොඩ වැදුණු මා හාෆ් ශීට් බණ්ඩලයකුත්, සටහන් බහාලීමට මෙන්ම, හාෆ් ශීට්වල ලිවීමේ දී ආධාරකයක් ලෙස භාවිතා කිරීමට ද හැකි ඝණ ප්ලාස්ටික් ෆයිල් කවරයකුත්, විවිධ වර්ණයේ පෑන් කිහිපයකුත් මිළට ගත්තෙමි.

ඒ සඳහා මා මුදල් ගෙවන කවුන්ටරය අසලට ගිය විට, එහි දී මා දුටුවේ මා එවකට සේවය කළ ආයතනයේ ම සේවයේ නියුතුව සිටි ලිපිකරු මහතෙකි. ඔහු එහි කවුන්ටරයේ සිටි පුද්ගලයා ගේ මිතුරෙක් සේ හැඟිණි.

"හලෝ කොහොමද?" කියා ඔහු මා සමග සිනාසී කතා කළේ ය.

එකෙනෙහිම ඔහු ගේ නෙත ගැටුණේ මා අත තිබූ හාෆ් ශීට් බණ්ඩලය ඇතුලු භාණ්ඩ කිහිපයයි. ඒ දුටු විගස ඔහුගේ දෙනෙත් විශ්මයාර්ථයක් දක්වමින් විසල් වෙනවා පෙනුණි.

"ආ! හාෆ් ශීට් කඩෙනුත් ගන්නවා ද?" ඔහුගේ මුවට ක්ෂණයකින් නැගුණු වදන් පෙළ එය විය.

ඒ ගැන ඊට වඩා වැඩි විස්තර කිරීමක් අවශ්‍ය නොවේ යැයි සිතමි.

ADVICE ON LEGAL MATTERS

Business & Commercial Law
Sale & Purchase of Busines | Leases | Franchises

Conveyancing
Residential, Commercial & Rural
Sale & Purchase | Vendor Statements
Auction Contracts | Contract of Sales
Subdivisions

Probate & Testamentary
Wills | Power of Attorney
(Foreign, Special, Enduring & Medical)
Deceased Estates & Administration

Family Law
Divorce | Consent Orders
Property Settlements | Binding Financial Agreements

Migration Law
General Skilled | ENS/RMS
Spouse | Contributory Parents
Visitor......etc

GATEWAY LAWYERS

Senanie Kurukularatne
Barrister & Solicitor
Director-Principal
Attorney-at-Law Sri Lanka
Registered Migration Agent
MARN 0854193

GATEWAY LAWYERS (AUSTRALIA) PTY LTD
PO Box 730 Berwick VIC 3806 Australia
DX 30463 Berwick VIC 3806 Australia
17 Glenview Rise Berwick VIC 3806 Australia

Tel +61 3 8786 9682
Fax +61 3 8786 9681
Mobile +61 414 660 513

info@gatewaylawyers.com.au
www.gatewaylawyers.com.au